# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1889/33 – 2014 නොවැම්බර් 20 වැනි බ්‍රහස්පතින්දා – 2014.11.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2014 අංක 331 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/12/2014/යූඩීජ්/283.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: කො/ප්‍රාලේ/ඉඅත්/3/88/යූඩීජ්.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2014 නොවැම්බර් මස 17 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, කොළඹ.

2. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාදම්පිටිය (කොට්ඨාස අංක 6, බ්ලූමැන්ඩල්, කොළඹ මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක සීඕ/සීඕඅයි/2014/679 හා 2014.09.15 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.1579 ක් පමණ වන ප්‍රමාණයෙන් හා නමින් යුතු ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – වරි. අංක 478/6ඒ, කේ. සිරිල් සී. පෙරේරා මාවත (සාම විහාරස්ථානය බ්ලූමැන්ඩල්) – ප්‍රමාණය: හෙක්. 0.1579**

උතුරට: කේ. සිරිල් සී. පෙරේරා මාවතේ වරි. අංක 478/18, 478/19 දරන ඉඩම්, ප්‍රවේශ මාර්ගය සහ ටුයිකෝ පුද්ගලික සමාගම පිහිටා ඇති කේ. සිරිල් සී. පෙරේරා මාවතේ වරි. අංකය සොයාගත නොහැකි ඉඩම; නැගෙනහිරට: ටුයිකෝ පුද්ගලික සමාගම පිහිටා ඇති කේ. සිරිල් සී. පෙරේරා මාවතේ වරි. අංකය සොයාගත නොහැකි ඉඩම; දකුණට: ඇළ රක්ෂිතය; බටහිරට: ඇළ රක්ෂිතය සහ කේ. සිරිල් සී. පෙරේරා මාවතේ වරි. අංක 478/18, 478/19 දරන ඉඩම්.

12 – 179




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*